# නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය

# සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

මෙම අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා **තාවකාලික පදනම යටතේ** පිළිගත හැකි සේවා පලපුරුද්දක් සහිත සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

| | තනතුර | අධ්‍යාපන සුදුසුකම් | බඳවා ගැනීම් කාලය | සේවක සංඛ්‍යාවට අදාල වන වැටුප (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025) | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | කළමනාකරණ සහකාර(තාක්ෂණික) (සිවිල් / සැලසුම් ශිල්පී / ප්‍රමාණ හා මිණුම් සමීක්ෂණ) | තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා **NVQ** පහ (05) වැනි මට්ටමට නොඅඩු ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කර තිබීම. | මාස 03 (අවශ්‍ය අවස්ථාවලදි දීර්ඝ කරගැනීමට යටත්ව.) | **MA 2-2 - 2025** රු.50,540 – 10 x 540 –7 x 630 - 4 x 1080 - 20 x 1280 - 90,270 | 05 |
| 2 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍යපෙළ) විභාගයේදී **i.**සිංහල/දෙමළ **ii.**ගණිතය යන විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් 6කින් සමත්ව තිබීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ විභාගයේදී)අවම වශයෙන් විෂයයන් 03ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | මාස 03 (අවශ්‍ය අවස්ථාවලදි දීර්ඝ කරගැනීමට යටත්ව) | **MA 1-1 - 2025** රු.46,220 – 10 x 540 –7 x 630 - 4 x 890 - 20 x 1190 - 83,390 | 05 |
| 3 | කාර්යාල සහායක/ කම්කරු | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම. | මාස 03 (අවශ්‍ය අවස්ථාවලදි දීර්ඝ කරගැනීමට යටත්ව) | **PL 1 – 2025** රු. 40,500 -10 x 450 –10 x 490 - 7 x 540 - 15 x 590 - 62,530 | 03 |

ඒ අනුව දෛනික වැටුප්ලාභී පදනම මත දෛනික වේතනය සේවා ගණයේ ආරම්භක මාසික වැටුප සහ රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව 30න් බෙදා ගෙවීම් කරනු ලබන අතර, සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයාගෙන් 10% ද සේව්‍යයාගෙන් 15%ක්ද සේවක භාරකාර අරමුදලට සේව්‍යයාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලැබේ.

**වයස් සීමාව:**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට වැඩි නොවිය යුතුය. (අයදුම්පත් භාරගන්නා අවසන් දිනය:2025.09.15)

අයදුම්පත් සහ අනෙකුත් සවිස්තරාත්මක තොරතුරු සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නිල වෙබ් අඩවියෙන් පහත සබැඳිය ඔස්සේ භාගත කර ගත හැක:-

👉 **www.Condominium.lk**

සුදුසුකම් සනාථ කිරීම සඳහා අයදුම්පත සමඟ පහත ලේඛණවල පිටපත්ද අමුණා තිබිය යුතුය.

- අධ්‍යාපන සහතික
- සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
- ජාතික හැඳුනුම්පත
- පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය

**සෑම අයදුම්කරුවෙක්ම,**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**පොදු කොන්දේසි :-**

- මෙම බඳවා ගැනීම් හුදෙක්ම තාවකාලික පදනම යටතේ බඳවාගන්නා තනතුරක් වන අතර මෙම පත්වීම් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ස්ථිර තනතුරකට හිමිකම් ලැබීමට සුදුසුකමක් නොවනු ඇත.
- අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම, ලිපිනය සහිත තොරතුරු අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.
- අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් අනතුරුව අනාවරණය වන්නේ නම් අදාල ඕනෑම අවස්ථාවකදී පත්වීම අවලංගු කිරීම හෝ සේවයෙන් පහකිරීමේ බලය අධිකාරිය සතුවේ.
- 2025.09.15 දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් සහ අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.

**අයදුම්පතේ කවරයෙහි වම්පස ඉහළ කෙලවරේ ඔබ විසින් අයදුම් කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.**

අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය:

**සාමාන්‍යාධිකාරී,**<br>
**සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය,**<br>
**පළමු මහල,**<br>
**ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ල,**<br>
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,**<br>
**කොළඹ 02.**